*චක්‍රලේඛ අංකය: 16 /2011,*

මගේ අංකය: කේ.4/ළමා සුරකුම්/2011,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2011.07.23 වෙනි දින.

*සියළුම අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් වෙත.*

## කළුතර ළමා සුරකුම් මධ්‍යස්ථානය

විශ්ව ළමා ප්‍රඥප්තියට අනුව, ළමා අයිතීන් සුරැකීම වශයෙන් මව්වරුන් සමග බන්ධනාගාරගත වීමට සිදුවන අවු: 05 ට අඩු ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීමට අදාල ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ඕනෑම අධිකරණයකින් අවුරුදු 10 ට නොවැඩි සිරදඩුවමක් නියම කරන එමෙන්ම කාගේ හෝ පිළිසරණක් නොමැති අවු: 05 ට අඩු දරුවන් සමග බන්ධනාගාර ගතවීමට සිදුවන මව්වරුන් එම ළමුන්ගේ ළමා අයිතීන් සුරැකෙන පරිද්දෙන් කළුතර බන්ධනාගාර ළමා සුරකුම් මධ්‍යස්ථානයේ රඳවා තැබීමට කටයුතු කල යුතුය. එම මව්වරුන් ඇතුලත් කරන බන්ධනාගාරවල ලියා පදිංචි කිරීම වෙනුවට කළුතර බන්ධනාගාරයට මාරු කිරීමෙන් පසු සිර ලියාපදිංචි කිරීම කල යුතුය.

එසේ හෙයින් මෙම සඟොහිලා සැලෙකෙන මව්වරුන් දඬුවම්කර බන්ධනාගාර ගත කිරීමට අධිකරණයක් මගින් නියෝගයක් නිකුත් කිරීමෙන් පසු අප්‍රමාදව කළුතර බන්ධනාගාර ළමා සුරකුම් මධ්‍යස්ථානයට මාරුකර යැවීමට මෙයින් නියෝග කරමි.

එම ආයතනයේ දී එකී ළමුන්ගේ අයිතීන් සුරැකෙන පරිද්දෙන් කටයුතු කිරීමටත්, එම මව්වරුන් බන්ධනාගාර ගත කිරීමට නියමකරන කාලය තුල එකී දරුවන් බන්ධනාගාරතුලට ඇතුල් නොකිරීමටත්, එම ළමුන් අධ්‍යාත්මික වශයෙන් හා මානසික වශයෙන් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා සකස්කර ඇති පෙර පාසැල වෙත යොමුකර ඔවුනට ලබාදිය යුතු පෙර පාසැල් පුහුණුව සහ ක්‍රියාකාරකම් වල නිරත කිරීමටත් අවශ්‍ය පියවර ගැනීමට ආයතන ප්‍රධානීන් වෙත මෙයින් දන්වා සිටිමි.

වී.ආර්.සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ අයිපී
මේජර් ජනරාල්,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.